**ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව -2017 වර්ෂය**

**--------------------------------------------------------------------------------------**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

**----------------------------------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයිම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

**--------------------**

ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරිම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 29 දිනදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත නිකුත් කරනු ලැබේ. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වනු ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.14 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දී මෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.10 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.1 (අ),(ආ) |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | කළමනාකරණ දුර්වලතා | 2.9 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.11 |
| 128(1)(ඉ) | රජය සතු වු හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.5 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම | 2.1.1 |
| | | 2. අග්‍රිම ගිණුමේ අඩුපාඩු | 2.12 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.10 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඎ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.11 (අ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව<br>(මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරිම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරිම) | අනාර්ථික ගණුදෙනු | 2.8 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | පාඩු හා හානි | 2.7 (අ), (ආ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.2 තිරසර සංවර්ධනය

**තිරසර අරමුණු ළගා කර ගැනීම**

තිරසර සංවර්ධනය පිළිබද එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය අයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව දැනුවත් වී තිබුණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් හඳුනාගෙන තිබුණු "නිරෝගී බව හා යහපැවැත්ම" යන අරමුණ යටතේ දත්ත එක්රැස්කිරීමේ කාර්යය සඳහා පත්කල නිලධාරීන්ට අවශ්‍ය භෞතික සම්පත් තවදුරටත් සපයා ගත යුතුව පැවතුණි.

### 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා සඳහා රු. මිලියන 22,509.59 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 21,038.66 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

#### 2.3.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 මාර්තු මස මාලි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතු සඳහා මුහුදු මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් කන්ටේනර් බහාළුම් 70 ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් රු. මිලියන 30.53 ක් ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2016 සැප්තැම්බර් 02 දින භාණ්ඩ සැපයීම සඳහා සැපයුම්කරු එකඟ වී තිබුණද, අදාල බහාළුම් 2017 ජනවාරි 06 දින ලබා දී තිබුණි. මේ සඳහා ප්‍රමාද ගාස්තු වශයෙන් රු. මිලියන 3.19 ක් දඩ මුදල් අයකල යුතු වුවද, සැපයුම්කරුගේ ඉල්ලීම මත එම මුදලින් සියයට 50 ක් වූ රු.මිලියන 1.53 ක් පමණක් අයකර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියළුම කඳවුරු සඳහා අමුපොල් සැපයීමට එකම පෞද්ගලික සමාගමක් වෙත ඉකුත් වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණි. ලෙලි රහිත පොල් කි:ග්‍රෑ 01 ක් සඳහා ගිවිසුම්ගතව පැවති මිල රු.39.20 සිට රු. 41 ක් දක්වා වූ පරාසයක වූ අතර, 2017 ජූනි 16 දින ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම ගිවිසුම්ගත මිල රු.65 ක් දක්වා වැඩිකර තිබුණි. ඒ අනුව, 2017 ජූනි 22 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ යුද්ධ හමුදාව අමු පොල් කි.ග්‍රෑම් 01 ක් රු.65 බැගින් කි.ග්‍රෑම් 6,078,355 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 395.1 ක් වැයකර තිබුණි. ගිවිසුම අනුව එකඟ වූ මිල වෙනස් කිරීමට විධිවිධාන සලසා නොතිබුණු බවද නිරීක්ෂණය විය.

## 2.4 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශීය ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු.මිලියන 1,599.36 ක ප්‍රතිපාදනද, විදේශ අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 02 ක් සඳහා රු.මිලියන 1,510 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් පිළිවෙලින් රු.මිලියන 1,590.66 ක් හා රු.මිලියන 1,242.11 ක් වශයෙන් රු.මිලියන 2,832.77 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 276.59 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 8.89 ක ප්‍රතිපාදනය ඉතිරිකර තිබුණි. විස්තර පහත දැක්වේ.

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 කාර්යාල පවත්වා ගැනීමේ වියදම්

කොළඹ නගර සංවර්ධන කටයුතු සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි ඉඩම් හා ගොඩනැගිලි නිදහස් කිරීමට සිදුවීම හේතුවෙන් යුධ හමුදා මූලස්ථානයේ ශාඛා සහ අධ්‍යක්ෂ මණ්ඩල පවත්වා ගෙන යාම සඳහා 2011 වර්ෂයේ සිට කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කටයුතු කර තිබුණි. 2011 වසරේ සිට ගොඩනැගිලි කුලී වශයෙන් රු. මිලියන 1,074.1 ක් ගෙවා තිබුණු අතර, එම වියදම තුළ 2017 වර්ෂයේ කුලී වියදම රු. මිලියන 470.3 ක් ද ඇතුලත්ව තිබුණි.

### 2.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

වේයන්ගොඩ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් රෙදිපිළි ගබඩාව තුල පසුගිය වර්ෂ 3 කට පෙර මිලදී ගෙන තිබුණු වටිනාකම රු. මිලියන 6.6 ක් වූ සුදු කැන්වස් සපත්තු යුගල 1,479 ක් නිශ්කාර්යව පැවතුණි.

### 2.5.3 ගබඩා හා ගබඩා පරිපාලනයේ දුර්වලතා

2011 වර්ෂයේ සිට ගම්පහ දිස්ත්‍රික්කයේ ජනාකීර්ණ ප්‍රදේශයක ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසි අවිගබඩාවක් පවත්වා ගෙන යන බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම ගබඩාව සඳහා යොදා ගෙන තිබුණු ගොඩනැගිලි රජයේ පෙහෙ කම්හලක් සඳහා ඉදිකර තිබුණු ඒවා වූ අතර, මෙම කාර්යය සඳහා එම ගොඩනැගිලි වල යෝග්‍යතාවය පිළිබඳ විමර්ෂණයක් සිදු කල බවට සාක්ෂි ලැබී නොතිබුණි. මෙම ගබඩාව දුම්රිය මාර්ගය, ආර්ථික මධ්‍යස්ථානය සහ මධ්‍ය මහා විද්‍යාලය වැනි පොදු ස්ථානවලට සමීපව පැවතීම හේතුවෙන් ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින අවදානම විගණනයේදී බැහැර කල නොහැක. අවි ආයුධ සැපයුම්කාර ආයතන 2 කට අයත් පතරොම් සහ වෙඩි බෙහෙත් ද්‍රව්‍ය ඒකක 17,866,171ක් උක්ත අවි ගබඩාව තුල 2011 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා ගබඩා කර තිබුණි.

## 2.6 බැදීම් හා බැරකම්

--------------------

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

-----------------------------------------------------

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 5,742.02 ක ප්‍රතිපාදනය රු.මිලියන 1,100.21 කින් ඉක්මවා රු.මිලියන 1,668.08 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

## 2.7 පාඩු හා හානි

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2018 සැප්තැම්බර් 25 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිද්ධීන් 121 ට අදාල රු.මිලියන 13,133.19 ක් වූ තව දුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට යටත් හානි හා පාඩු හඳුනාගෙන තිබුණි. එයින් සිද්ධීන් 47 කට අදාල වර්ෂ 10ට වැඩි වටිනාකම රු. මිලියන 497.70 ක් වූ පාඩු හා හානි ද ඊට ඇතුලත් විය.

**(ආ)** 2016 ජුනි මස 05 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාලාව කඳවුර තුළ පිහිටි අවි ගබඩාවේ පිපිරීමෙන් සිදුවූ අලාභයන් සහ වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් සිදු කල මූලික පරීක්ෂණ උසාවි කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන විට නිමකර තිබුණු බවත් ඒ අනුව රාජ්‍ය අරමුදල් උපයෝජනය කර මිලදී ගෙන තිබුණු අවිආයුධ, වාහන , භාණ්ඩ හා උපකරණ විනාශ වීම මත පාඩුව රු.මිලියන 12,817.76 ක් බවට නිශ්චය කර තිබුණි. මුදල් රෙගුලාසි 104(4) හා මුදල් රෙගුලාසි 109 අනුව අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව හානි පාඩු පොත් වලින් කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවට අනාවරණය විය.

## 2.8 අනාර්ථික ගනුදෙනු

---------------------

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් තත්‍ය අවශ්‍යතාවයන් ඉක්මවා භාණ්ඩ මිලදී ගත් අවස්ථා නිරීක්ෂණය විය.ඒ අනුව අවශ්‍යතාවය ඉක්මවා 2015, 2016 සහ 2017 වර්ෂයන්හිදී පිළිවෙලින් සපත්තු යුගල 18,348 ක්, 33,184 ක් හා 28,121 ක් යුධ හමුදාව විසින් මිලදී ගෙන තිබුණි.

## 2.9 කළමනාකරණ දුර්වලතා

-------------------------

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ස්ටම්ප් සොක්ස් (Stump Socks) 25,800 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණු අතර, ඉන් යුගල 10,100 ක් වේයන්ගොඩ රෙදිපිළි ගබඩාව වෙත ලැබී තිබුණි. එහි තත්ත්ව පරීක්ෂණ වාර්තාව අනුව අනුමත සාම්පලය සමඟ නොගැලපුනද අවශ්‍යතාවය සලකා තොගයට ගැනීමට නිර්දේශ කර තිබුණි. ඉතිරි ස්ටම්ප් සොක්ස් 15,700 ක ප්‍රමාණයද සියයට 70 ක මට්ටමින් අනුමත සාම්පලය සමග ගැලපෙන බැවින් තොගයට ගැනීමට නිර්දේශ කර තිබුණි.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 115,202.96 | 115,164.75 | 38.21 | 0.033 |
| | මූලධන | 7,427.37 | 7,365.15 | 62.22 | 0.838 |
| | **එකතුව** | **122,630.33** | **122,529.90** | **100.43** | **0.081** |
| 2014 | පුනරාවර්තන | 135,287.68 | 135,282.25 | 5.44 | 0.004 |
| | මූලධන | 9,588.29 | 7,504.00 | 2,084.29 | 21.737 |
| | **එකතුව** | **144,857.97** | **142,786.25** | **2,089.72** | **1.443** |
| 2015 | පුනරාවර්තන | 151,629.47 | 151,624.68 | 4.78 | 0.003 |
| | මූලධන | 8,185.43 | 6,726.65 | 1,458.77 | 17.821 |
| | **එකතුව** | **159,814.90** | **158,351.33** | **1,463.55** | **0.915** |
| 2016 | පුනරාවර්තන | 151,664.60 | 144,320.60 | 7,343.99 | 4.842 |
| | මූලධන | 8,731.75 | 3,805.83 | 4,925.92 | 56.414 |
| | **එකතුව** | **160,396.35** | **148,126.43** | **12,269.91** | **7.649** |
| 2017 | පුනරාවර්තන | 146,393.93 | 142,925.89 | 3,468.04 | 2.368 |
| | මූලධන | 11,772.05 | 9,529.58 | 2,242.46 | 19.049 |
| | **එකතුව** | **158,165.98** | **152,455.47** | **5,710.50** | **3.610** |

### (අ) විසර්ජන ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

වැය විෂයයන් 01 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 24 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය මුළුමණින්ම උපයෝජනය කර නොතිබුණි.

#### (ii) වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

වෙනත් අමාත්‍යාංශ 03 ක් සහ කාර්යාල 02 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 566.77 ක් හා රු. මිලියන 700.96 ක් වශයෙන් එකතුව රු.මිලියන 1,267.73 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 1,030.75 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන වලින් රු.මිලියන 236.98 ක් හෙවත් සියයට 18.69 ක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි.

**2.11** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාල විෂය අංක 22201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3,300.00 | 3,299.87 | 2,540.00 | 2,540.86 | 4,542.00 | 2,240.85 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2018 අගෝස්තු 31 දිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 78,220,340 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01ක සිට වර්ෂ 05 කට වැඩි කාලයක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අපොහොසත් වී තිබුණි.

**2.12** **අග්‍රිම ගිණුම**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ වූ අග්‍රිම ගිණුමේ ශේෂය 2018 අගෝස්තු 31 දිනට රු.මිලියන 40.29 ක් විය. එම ශේෂය තුළ 2008 සහ 2011 වර්ෂවල සිට පැවත එමින් තිබුණු පිළිවෙලින් රු.මිලියන 2.81 ක් හා රු.මිලියන 2.64 ක් මේ දක්වා නිරවුල් වී නොතිබුණි.

**2.13** **පොදු තැන්පත් ගිණුම**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ තැන්පත් ගිණුම් 6 ක 2017 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂවල එකතුව රු.මිලියන 75.72 ක් විය මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කල යුතු වුවත් 2018 අගෝස්තු 31 දිනට නිරවුල් කිරීමට පැවති කල් ඉකුත් වූ තැන්පතු වටිනාකම රු.441,000 ක් විය.

**2.14** **මානව සම්පත් කළමනාකරණය**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 116,824.87ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.640,789 ක් වී තිබුණි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය කරනු ලැබූ නිලධාරී සහ සෙසු නිල සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| නිලධාරී- නිත්‍ය/ස්වේච්ඡා | 10,656 | 9,290 | 1,366 |
| සෙසු නිල - නිත්‍ය/ස්වේච්ඡා | 189,853 | 162,589 | 27,264 |
| **එකතුව** | **200,509** | **171,879** | **28,630** |

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය කරනු ලැබූ සිවිල් කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | තෘතියික මට්ටම | 19 | 13 | 6 | - |
| (ii) | ද්විතියික මට්ටම | 199 | 148 | 51 | - |
| (iii) | ප්‍රාථමික මට්ටම | 6,391 | 8,974 | - | 2,583 |
| (iv) | අනියම්/කොන්ත්‍රාත් | 4,537 | 1,300 | 3,237 | - |
| | | 11,146 | 10,435 | 3,294 | 2,583 |

ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව වන 2,583 ක් සඳහා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/ඒ08/21 හා 2009 නොවැම්බර් 30 දිනැති ලිපිය මගින් සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේක 25/2014 මගින් අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවට පරිබාහිරව සහ අධි සේවක පදනම මත ස්ථිර කිරීමට අනුමැතිය ලබා දී ඇති බව දක්වා තිබුණි.